**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**

**பொலிஸ் ஊடகப் பிரிவு**

**POLICE MEDIA DIVISION**

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය<br>Date | 2025.04.08<br>පැය 2310 | දුරකථන අංකය<br>Tel.NO | 011-2887973 | මගේ අංකය<br>My NO | D/Media/Out/ 687/2025 | විද්‍යුත් ලිපිනය<br>E-Mails | dir.media@police.gov.lk |

**අසභ්‍ය වීඩියෝ දර්ශන හා නිරුවත් ඡායාරූප අන්තර්ජාලය හරහා යොමු කරමින් ලිංගික හිරිහැර සිදුකිරීම සම්බන්ධව සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පරිගණක අපරාධ විමර්ශන වයඹ පළාත් ඒකකය.**

නිරුවත් ඡායාරූප හා අසභ්‍ය වීඩියෝ දර්ශන වට්ස්ඇප් ඇතුළු සමාජ මාධ්‍ය ඔස්සේ යොමු කරමින් ලිංගික හිරිහැර සිදුකිරීමේ අපරාධ සිද්ධීන් දෙකකට අදාලව සැකකරුවන් දෙදෙනෙකු පරිගණක අපරාධ විමර්ශන වයඹ පළාත් ඒකකය මඟින් අත්අඩංගුවට ගෙන ඇත.

01. නිරුවත් ඡායාරූප හා අසභ්‍ය වීඩියෝ දර්ශන වට්ස්ඇප් ඇතුළු සමාජ මාධ්‍ය ඔස්සේ යොමු කර ඒවා ප්‍රචාරය කරන බවට තර්ජනය කරමින් රුපියල් 222,000/= මුදලක් බලෙන් ලබා ගැනීම සම්බන්ධයෙන් 2025.01.08 වන දින වයඹ පළාත් පරිගණක අපරාධ විමර්ශන ඒකකයට ලද පැමිණිල්ලකට අනුව විමර්ශනය සිදු කර 2025.04.08 වන අද දින දහවල් කාලයේ කොළඹ කොටුව ප්‍රදේශයේදී එම සිද්ධියට සම්බන්ධ සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

    **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන පන්නිපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

02. නිරුවත් ඡායාරූප හා අසභ්‍ය වීඩියෝ දර්ශන වට්ස්ඇප් ඇතුළු සමාජ මාධ්‍ය ඔස්සේ යොමු කරමින් ලිංගික හිරිහැර සිදු කරන බවට 2025.01.07 වන දින වයඹ පළාත් පරිගණක අපරාධ විමර්ශන ඒකකයට ලද පැමිණිල්ලකට අනුව විමර්ශනය සිදු කර 2025.04.08 වන අද දින දහවල් කාලයේ කහතුඩුව ප්‍රදේශයේදී එම සිද්ධියට සම්බන්ධ සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

    **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන බණ්ඩාරගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පරිගණක අපරාධ විමර්ශන වයඹ පළාත් ඒකකය මඟින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**